# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

**සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**சமூக வலுவூட்டல் அமைச்சு**
**MINISTRY OF SOCIAL EMPOWERMENT**


| මගේ අංකය<br>**எனது இல**<br>**My No** | DSD/HO/04/ER/09/ජාතික ආහාර.නි............... | ඔබේ අංකය<br>**உமது இல**<br>**Your No** | ............................................ | දිනය<br>**திகதி**<br>**Date** | 2018.12.10.......................... |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

**<u>"සරු පිරි ගෙවත්ත" ගෙවතු සංවර්ධන වැඩසටහන - 2018</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ට ද පිටපතක් සහිතව සියළු දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතු අංක 4/4/2/1/1 හා 2018.10.17 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලේකම් විසින් නිකුත් කර ඇති 03/2018 චක්‍රලේඛණය හා බැදේ. (අදාල චක්‍ර ලේඛණයේ පිටපතක් මීට අමුණා ඇත.)

02. ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා, සපයා ඇති නිර්ණායකයන්ට අනුව දිවයින පුරා සෑම ගොවිජන සේවා කොට්ඨාශයකින්ම ප්‍රතිලාභී පවුල් 150 ක් තෝරා ගත යුතුව ඇත. මෙම ප්‍රතිලාභීන් තෝරා ගැනිම සඳහා නම් කර ඇති ග්‍රාමීය කමිටුවේ සාමාජිකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිලධාරී ද ඇතුලත් කර ඇත. (03 ඡේදයට අදාලව)

03. මෙම ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ එක් ප්‍රතිලාභී පවුලක් සඳහා රු. 500/- ක් වටිනා පලතුරු පැල 03ක් හා කෘෂි දේශගුණික කලාප අනුව ගැලපෙන ගෙවතු වගා බීජ කට්ටලයක් සපයා දිය යුතු වේ.

04. එබැවින් මෙම වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන වැඩසටහනට සම්බන්ධ ඔබ දිස්ත්‍රික්කයේ නිලධාරීන්ගේ සහාය ලබාදෙන මෙන් කාරුණිකව දන්වමි.

05. මීට අමතරව 2018 වර්ෂයේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක සමෘද්ධි ආදර්ශ ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ හඳුනාගත් පවුල් අතරින් මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක කරන ප්‍රතිලාභීන් මෙම වැඩසටහනට ඇතුලත් කිරීමේ හැකියාව කෙරෙහිද ඔබගේ අවධානය යොමු කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව ඉල්ලමි.

නිමල් කොටවලගෙදර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

පිටපත්:-
1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (ඔබගේ අංක 4/4/2/1/1හා 2018.10.17 දිනැති චක්‍ර ලේඛ අංක 3-2018 ට අදාලව - කා.දැ.ගැ.පි.
2. අතිරේක ලේකම්, සමාජ සුභසාධන අංශය , නිවාස හා සමාජ සුභසාධන අමාත්‍යාංශය - (ඔබගේ අංක MSC/ADM/4/1 හා 2018.12.03 දිනැති චක්‍රලේඛ අංක 3-2018 ට අදාලව කා.දැ.ගැ.පි.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>**பணிப்பாளர் தலைமையதிபதி**<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>**பணிப்பாளர்** ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>**பிரதான கணக்காளர்**<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>**அலுவலகம்**<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |